# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 20 දරන

# රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා

# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් විශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 35 යි　　තැපැල් ගාස්තුව: ශත 35 යි

# 1980 අංක 20 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 57/79.

**1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 20 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (vii) සහ (viii) යන ඡේද අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1972 අංක 11 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(vii) මේ පනතේ විධිවිධානවලට අනුකූලව මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම ;

(viii) ඒ විධිවිධානවලට අනුකූලව ඒ මණ්ඩලයේ සභාපතිවරයා පත් කිරීම ; සහ

(ix) ඒ විධිවිධානවලට අනුකූලව ඒ මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයා පත් කිරීම.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයන් අතුරින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයකු පත් කරනු ලැබිය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයකු ද පත් කරනු ලැබිය හැකි ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා.

16. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාගේ හෝ නියෝජ්‍ය සභාපතිවරයාගේ හෝ ධුර කාලය ඒ මණ්ඩලයේ ඔහුගේ සාමාජික කාලය විය යුතු ය :

එසේ වුවද අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා විසින් ඊට කලින් තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය. නැතහොත් සභාපතිවරයාගේ හෝ නියෝජ්‍ය සභාපතිවරයාගේ හෝ පත්වීම හේතු නො දක්වා කවර වූ හෝ විටක අමාත්‍යවරයා විසින් අවසන් කරනු ලැබිය හැකි ය.".

2—ඒ 48854—10,600 (80/04)

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා තමා පැමිණ සිටින අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයා මණ්ඩලයේ යම් රැස්වීමකට නො පැමිණි විටක අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයා විසින් හෝ නියෝජ්‍ය සභාපතිවරයා නො පැමිණි විටක, නැතහොත් නියෝජ්‍ය සභාපතිවරයකු පත් කරනු ලැබ නැති අවස්ථාවක, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන්ගෙන් වැඩි දෙනා විසින් තෝරා ගනු ලැබූ අධ්‍යක්ෂවරයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දරනු ලැබිය යුතු ය.".